# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2250/37 – 2021 ඔක්තෝබර් 22 වැනි සිකුරාදා – 2021.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2018 ජනවාරි මස 15 වැනි දින අංක 2054/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2018 අංක 01 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් එකී ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2016/ HW/178.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: BER/4/5/5/10.
2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මග්ගොන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කේජ්/බීආර්ඩබ්ලිව්/2016/418 හා 2017.11.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0191**

උතුරට: එස්. ඩී. නිලන්ත පෙරේරා හිමිකම් කියන තෝප්පුවවත්ත; නැගෙනහිරට: එස්. ඩී. නිලන්ත පෙරේරා, එච්. ජී. සී. රන්ජන් හිමිකම් කියන තෝප්පුවවත්ත සහ කැබලි අක්ෂර සී; දකුණට: කැබලි අක්ෂර සී, බී සහ ගාලු පාර; බටහිරට: ගාලුපාර.

02. **කැබලි අක්ෂර 'බී' – තෝප්පුවවත්ත– ප්‍රමාණය: හෙක්. 0.0042**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ සී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී; දකුණට: කැබලි අක්ෂර සී, බී සහ ගාලු පාර; බටහිරට: ගාලු පාර.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. කැබලි අක්ෂර 'සී' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0099

උතුරට: කැබලි අක්ෂර ඒ, එස්. ඩී. නිලන්ත පෙරේරා සහ එච්. ජී. සී. රන්ජන් හිමිකම් කියන තෝප්පුවවත්ත; නැගෙනහිරට: එච්. ජී. සී. රන්ජන්, එම්. එම්. පාතිමා රිස්නා හිමිකම් කියන තෝප්පුවවත්ත සහ කැබලි අක්ෂර එච්; දකුණට: කැබලි අක්ෂර එච් සහ ගාලු පාර; බටහිරට: ගාලුපාර සහ කැබලි අක්ෂර බී.

04. කැබලි අක්ෂර 'ඩී' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0012

උතුරට: එම්. එන්. ෆාතිමා ෆයිමා හිමිකම් කියන තෝප්පුවවත්ත සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර; දකුණට: ගාලු පාර, එම්. එස්. එම්. සියාදු සහ තවත් අය හිමිකම් කියන තෝප්පුවවත්ත; බටහිරට: එම්. එස්. එම්. සියාදු සහ තවත් අය, එම්. එන්. ෆාතිමා ෆයිමා හිමිකම් කියන තෝප්පුවවත්ත.

05. කැබලි අක්ෂර 'ඊ' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0003

උතුරට: කැබලි අක්ෂර ඩී සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර සහ කැබලි අක්ෂර එෆ්; දකුණට: කැබලි අක්ෂර එෆ් සහ එම්. එස්. එම්. සියාදු හිමිකම් කියන තෝප්පුවවත්ත; බටහිරට: එම්. එස්. එම්. සියාදු සහ තවත් අය හිමිකම් කියන තෝප්පුවවත්ත.

06. කැබලි අක්ෂර 'එෆ්' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0004

උතුරට: කැබලි අක්ෂර ඊ සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර; දකුණට: එම්. එස්. එම්. සියාදු හිමිකම් කියන තෝප්පුවවත්ත; බටහිරට: එම්. එස්. එම්. සියාදු සහ තවත් අය හිමිකම් කියන තෝප්පුවවත්ත.

07. කැබලි අක්ෂර 'එච්' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0054

උතුරට: කැබලි අක්ෂර සී, එච්. ජී. සී. රන්ජන් සහ එම්. එම්. පාතිමා රිස්නා හිමිකම් කියන තෝප්පුවවත්ත; නැගෙනහිරට: එම්. එම්. පාතිමා රිස්නා හිමිකම් කියන තෝප්පුවවත්ත; දකුණට: කැබලි අක්ෂර ජේ සහ ගාලු පාර; බටහිරට: ගාලු පාර සහ කැබලි අක්ෂර සී.

08. කැබලි අක්ෂර 'ජේ' – තෝප්පුවවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0022

උතුරට: කැබලි අක්ෂර එච්, එම්. එම්. පාතිමා රිස්නා සහ එම්. එම්. ෆාතිමා රිෆ්කා, හිමිකම් කියන තෝප්පුවවත්ත; නැගෙනහිරට: එම්. එම්. ෆාතිමා රිෆ්කා, එස්. ඩී. නිශාන්ත පෙරේරා හිමිකම් කියන තෝප්පුවවත්ත සහ කැබලි අක්ෂර කේ; දකුණට: කැබලි අක්ෂර කේ සහ ගාලු පාර; බටහිරට: ගාලු පාර සහ කැබලි අක්ෂර එච්.

11 - 65

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2017 දෙසැම්බර් මස 13 වැනි දින අංක 2049/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි පරිච්ඡේදය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2017 අංක 326 හා 2017.12.13 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/ VE/215.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DIK/LAN/02/60.
2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, වලස්ගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක MR/DKW/2017/421 හා 2017.11.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – ප්‍රමාණය: හෙක්. 0.0149

උතුරට: මාර්ගය (ප්‍රා.ස.); නැගෙනහිරට: මතෙස් නම්බු හේවාගේ සිරිවර්ධන සහ තවත් අය හිමිකම් කියන බෝගහදෙනිය; දකුණට: කැබලි අක්ෂර **B**; බටහිරට: හෙට්ටියා දූරගේ චන්දිමා දිල්හානි හිමිකම් කියන ගොඩකදුරුගහවත්ත. නොහොත් ජූල්ගහවත්ත.

02. කැබලි අක්ෂර **'B'** – බුලත්දළුගහවත්ත සහ පන්විලහේන – ප්‍රමාණය: හෙක්. 0.5075

උතුරට: කැබලි අක්ෂර A සහ මතෙස් නම්බු හේවාගේ සිරිවර්ධන සහ තවත් අය හිමිකම් කියන බෝගහදෙනිය; නැගෙනහිරට: මතෙස් නම්බු හේවාගේ සිරිවර්ධන සහ තවත් අය හිමිකම් කියන බෝගහදෙනිය, මහ දූරගේ සම්පත් විමලසිරි හිමිකම් කියන වෙලගෙදර නොහොත් රුප්පෙකොරටුව, මහ දූරගේ රේණුකා හිමිකම් කියන වෙලගෙදර නොහොත් රුප්පෙකොරටුව සහ කුනන්දූර කංකානම්ගේ ආරියදස හිමිකම් කියන වෙලගෙදර නොහොත්

රුප්පෙකොරටුව; දකුණට: මහ දූරගේ සම්පත් විමලසිරි හිමිකම් කියන වෙලගෙදර නොහොත් රුප්පෙකොරටුව, මහ දූරගේ රේණුකා හිමිකම් කියන වෙලගෙදර නොහොත් රුප්පෙකොරටුව, කුනන්දූර කංකානම්ගේ ආරියදස හිමිකම් කියන වෙලගෙදර නොහොත් රුප්පෙකොරටුව සහ ජයසිංහ ආරච්චිගේ වීරසේන හිමිකම් කියන වඩුගෙදර නොහොත් මහවත්ත; බටහිරට: ජයසිංහ ආරච්චිගේ වීරසේන හිමිකම් කියන වඩුගෙදර නොහොත් මහවත්ත සහ හෙට්ටියා දූරගේ චන්දිමා දිල්හානි හිමිකම් කියන ගොඩකදූරුගහවත්ත නොහොත් ජුල්ගහවත්ත.

11 - 66

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

මගේ අංකය: LD/05/2010/VE/75.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DER8LAN/LAQU17/A1/06.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරිය) 18 වගන්තිය ප්‍රකාරව ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම අංක 2122/20 හා 2019.05.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ 1A පිටුවේ පළකරන ලද 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය මෙයින් අවලංගු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 ජූලි මස 22 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 67

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.